# ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය මත පදනම් වූ කර්මාන්ත සංවර්ධනයේ සීමා

කුළුණුසෙන් යසකේතු
ශේ. සං. අ. ආයතනය — ගන්නොරුව

ශ්‍රී ලංකාව කෘෂිකර්මය සඳහා ස්වභාවික සම්පත් මැනවින් ඇති රටක් වුවත් සංවර්ධනය වූ කෘෂි - කාර්මික ක්ෂේත්‍රයක් දක්නට නොලැබේ. නවීන කෘෂි තාක්ෂණික දියුණුවත් සමඟ කෘෂි නිෂ්පාදනය ඉහළ ගිය බව අපි දනිමු. එහෙත් නිෂ්පාදනය ඉහළ ගිය පමණින් ගොවියාගේ ආර්ථිකය නඟා සිටුවිය හැකිද? නැත; ආර්ථිකය නඟා සිටුවීමට හැක්කේ එම නිෂ්පාදිතය මුදල්මය තත්වයකට පත් කළහොත් පමණි. ඒ සඳහා නිෂ්පාදිතය අලෙවි කළ යුතුය. දේශීය වශයෙන් හෝ වේවා, විදේශීය වශයෙන් හෝ වේවා අපගේ නිෂ්පාදිතය අලෙවි කිරීමේදී වැඩි මිළක් ලබා ගැනීම අපේ අරමුණයි. එසේ නම් ඒ සඳහා අප විවිධ උපාය මාර්ග අනුගමනය කළ යුතුය. නිෂ්පාදිතයේ ප්‍රාථමික ස්වරූපයෙන්ම ඒවා අලෙවි කිරීමේ පුරුද්දෙන් බැහැරව කෘෂි පිරියම් ක්‍රම අනුගමනය කරමින් විවිධ ස්වරූපයෙන් අපගේ නිෂ්පාදිතය වෙළඳ පලට ඉදිරිපත් කළ යුතුය. මේ සඳහා සංවිධානාත්මක ක්‍රියාමාර්ගයක් අවශ්‍යව ඇත.

මෙසේ කෘෂි පිරියම් කිරීමේ කටයුතු ආරම්භ කර, කෘෂි කාර්මික සංවර්ධනයක් දැකීමට නම් පළමුව අප ලබා ගන්නා අස්වැන්න හොඳ තත්වයේ තිබීම අත්‍යාවශ්‍යය. කෘෂි ණය, ද්‍රව්‍යමය සැපයුම්, ජල පහසුකම් හා නවීන කෘෂි දැනුම ගොවියාට මනාව ලබා දීමෙන් නිෂ්පාදිතයේ තත්වය අපට ඉහළ නැංවිය හැක. දෙවනුව නිෂ්පාදිතයේ සැකසීම හා අලෙවිය අතර සම්බන්ධතාවයක් තිබිය යුතුය.

— ගොවියා වෙතින් නිෂ්පාදිතය එකතු කිරීම.
— තේරීම, ඇසිරීම.
— පාරිභෝගික අවශ්‍යතා අනුව සැකසීම.
— ප්‍රවාහනය.
— තොග හා සිල්ලර බෙදා හැරීම.

යනාදි කරුණු සමඟ බැඳී පවතින අලෙවි සම්බන්ධතාවයක් නොමැති වීම ශ්‍රී ලංකාවේ කෘෂි කාර්මික අංශයේ පසු බැසීමට හේතු වී ඇත. මීට අමතරව දේශීය හෝ විදේශීය වෙළඳ පලට භාණ්ඩ සැපයීමේදී නවීන ලෝකයේ අවශ්‍යතාවයන්, ආකල්පයන් සමඟ තරඟ කිරීම සඳහා ඒවායේ,

— තත්වය,
— විවිධත්වය,
— දර්ශනීය ඇසුරුම, කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතුය.

**දැනට පවතින කෘෂි නිෂ්පාදිත පදනම් කරගත් කර්මාන්ත වල තත්වය.**

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වැවිලි බෝග තුනම කෘෂි පදනමක් සහිත කර්මාන්තවල ලක්ෂණ පෙන්වයි. විශේෂයෙන්ම තේ කර්මාන්තය කෘෂි කාර්මික ක්ෂේත්‍රයට හොඳ නිදසුනකි. එහෙත් තේ කර්මාන්ත ද තව දියුණු කිරීමට විභවය ඇත. වෙනස් වන වෙළඳ පොළ අනුව ඖෂධීය තේ, කැෆීන් රහිත තේ, ක්ෂණික තේ, රසකළ තේ යනාදිය තේ කර්මාන්තයට හඳුන්වාදිය යුතුය. එසේ නොමැතිව තේ තොග නිෂ්පාදනය කෙරෙහි පමණක් අවධානය යොමු කරන්නේ නම් අනාගතයේ දී වෙනත් රටවල විවිධ නිෂ්පාදිත හමුවේ අපේ තේ අසරණ වනු ඇත. මේ නිසා වෙනස් වන වෙළඳ පලට සරිලන පරිදි අපේ නිෂ්පාදිතය හැසිරවිය යුතුය.

දේශීය රබර් නිෂ්පාදිත සැලකූ විටද ඉන් කාර්මික වශයෙන් ප්‍රයෝජනයට ගන්නේ ඉතා සුළු ප්‍රමාණයකි. දේශීයව ටයර් හා වෙනත් රබර් භාණ්ඩ කර්මාන්ත වලට අමතරව රබර් ඇට තෙල් වලින් තීන්ත නිෂ්පාදනය ද, රබර්

ලීයෙන් ගෘහභාණ්ඩ නිෂ්පාදනය ද අද දේශීයව කෙරුනත් ඒ සඳහා යොදා ගන්නේ මුළු රබර් නිෂ්පාදිතයෙන් සියයට 12 පමණය. සාර්ථකව රබර් වගා කිරීමට හැකියාවක් තිබුනත් කාර්මීකරණයේ දුර්වලතාවය නිසා ශ්‍රී ලංකාව අද රබර් භාණ්ඩ ආනයනය කිරීම සඳහා රුපියල් කෝටි ගණන් වියදම් කරයි.

පොල් කර්මාන්තය තේ හා රබර් සමග සංසන්දනය කරණ විට අඩු තාක්ෂණික මට්ටම මෙන් වුවද තරමක් දුරට කාර්මීකරණය වී ඇතැයි සිතිය හැක. පොල් කර්මාන්ත යේ ගැනෙන පොල් තෙල්, කොහු, සබන්, පොල් කටු අඟුරු, විනාකිරි, පොල් කිරි, පොල් ලී භාණ්ඩ, මාගරින්, ඉදල් වැනි කර්මාන්ත අතරින් සමහරක් නවීකරණය වී ඇතත් තවමත් සමහරක් පැරණි ග්‍රාමීය, තාක්ෂණය මතම ක්‍රියාත්මක වෙ.

මීට අමතරව දේශීය කෘෂි නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්තයන් කීපයකි,

— සීනි කර්මාන්තය
— සුළු අපනයන බෝග පදනම කරගත් කර්මාන්ත
— අතිරේක ආහාර බෝග පදනම කරගත් කර්මාන්ත
— කිරි නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත
— මස් හා මස් නිෂ්පාදන කර්මාන්ත
— පළතුරු හා එළවළු ආශ්‍රිත කර්මාන්ත

**කෘෂි - කර්මාන්ත සංවර්ධනය කෙරෙහි බලපාන සීමා**

1. ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය නිසා දේශීයව නිෂ්පාදනය කළ හැකි කෘෂි නිෂ්පාදනයන් පවා නිදහසේ රට තුළට ගලා ඒමෙන් දේශීය නිෂ්පාදිකයන්ට ඇති ඉල්ලුම අඩුවීම.

2. කෘෂි කර්මාන්ත වලට මුදල් ආයෝජනයෙන් ලැබෙන ආර්ථික ලාභය අඩු නිසා වෙනත් ව්‍යාපාරික කටයුතු වලට මුදල් ආයෝජනය කිරීමට පෙළඹීම.

3. වෙළඳපොල හා වෙළඳපොල අවශ්‍යතා පිළිබඳ අවබෝධය අඩුවීම.

4. ප්‍රාථමික නිෂ්පාදිතය සකස් කිරීමේ ශිල්ප ක්‍රම පිළිබඳව තාක්ෂණික දැනුම අඩුවීම.

5. කාලීනව ලැබෙන කෘෂි නිෂ්පාදිතයන් ශිඝ කාලයේ දී ප්‍රයෝජනයට ගත හැකි වන සේ ගබඩා කර තැබීමට පහසුකම් අඩුවීම.

6. අඩු වියදම් සහිත උචිත තාක්ෂණික ක්‍රම නොමැතිකම නිසා දේශීය කෘෂි - කාර්මික නිෂ්පාදිතයන්ගේ නිෂ්පාදන වියදම අඩුවීම.

7. දේශීය කෘෂි කාර්මික නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ක්‍රමවත්ව සැලසුම් කරන ලද අලෙවි ක්‍රමයක් නොමැති වීම.

8. පාරිභෝගික අවශ්‍යතාවයන්ට සරිලනසේ විවිධ පිරිසැකසුම් ක්‍රම පිළිබඳව දිරි ගැන්වීම හා විකල්ප තාක්ෂණ ක්‍රම නොමැති වීම.

9. ප්‍රමාණාත්මක හා ගුණාත්මක කෘෂි කාර්මික නිෂ්පාදනය සඳහා අවශ්‍ය තාක්ෂණික හා ශිල්පීය දැනුම අඩුවීම.

කෙසේ වුවද කෘෂි - කාර්මික නිෂ්පාදනය ආරම්භයේ සිටම මනාව සැලසුම් කළ යුතු අතර නිෂ්පාදන වියදම අවම කර ගනිමින් වෙනස් වන වෙළඳ පොලට තරඟකාරී ලෙස ඉදිරිපත් කළ හැකි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ පොදු අරමුණ පෙරදැරි කරගත්තක් විය යුතුය.